ID 456

Major

# රුහුණු ජන වහර පිළිබඳ පර්යේෂණාත්මක අධ්‍යයනයක්

මුරුන්ගස්යායේ සාරද හිමි[1], අම්බාවේ ධම්මානන්ද හිමි[2], බදුල්ලේ සමිත හිමි[3], පොද්දිවල ගෝතම හිමි[4]

ලෝකයේ අලංකාර භාෂාවන් අතර ප්‍රමුඛ භාෂාවක් වන සිංහල භාෂාව ජීවමාන භාෂාවක් ලෙස කලින් කලට වෙනස් වෙමින් ලංකාව පුරාම පැතිර ඇති බැව් ප්‍රාදේශීය ව්‍යවහාර නැතහොත් උප භාෂා ලක්ෂණ තුළින් ගම්‍ය වේ. එකම භාෂාවක් කතා කරන භාෂා සමාජය පුළුල් පරාසයක් දක්වා ව්‍යාප්ත වීමත් සමග උපභාෂා ලක්‍ෂණ පහළ වේ. සැතපුම් සිය දහස් ගණනක් විශාල භූමි ප්‍රදේශයක මෙසේ භාෂා සමාජයක් විහිදී ගිය විටෙක ප්‍රදේශයෙන් ප්‍රදේශයට හෝ සමාජයෙන් සමාජයට භාෂා ව්‍යවහාරයෙහි යම් යම් වෙනස්කම් ඇති වේ. එසේ ප්‍රාදේශීය වශයෙන් හෝ සමාජ කොටස් අතර භාෂාමය වශයෙන් ව්‍යවහාර විවිධත්වයක් ඇති වීමෙහිලා බලපෑ හැකි කාරණා කිහිපයකි. ගමනාගමන පහසුකම් අඩුවීම, සන්නිවේදන පහසුකම් වෙනස් වීම, භූගෝලීය දුරස්ථ බව සහ සංස්කෘතික සංස්පර්ශ යන්ගේ බලපෑම යන කරුණු මතය. රුහුණු රට හෙවත් රුණ ලෙස හැඳින්වෙන මෙම ප්‍රදේශයට එම නම ලැබීමට ප්‍රධානත ම හේතුව වන්නේ හේන් ගොවිතැන ප්‍රධාන නිෂ්පාදන මාර්ගය බවට පත් කර ගත් වනාන්තර ආශ්‍රිත ප්‍රදේශයක් වීමයි. ලංකාව තුළ විහිදී තිබෙන ප්‍රදේශයෙන් ප්‍රදේශයට ද උපභාෂා ලක්ෂණ පවතින අතර එකම ප්‍රදේශයක් තුල උප භාෂා ලක්ෂණ දෙකක් හෝ ඊට වැඩි ගණනක් දැකිය හැකි ය. එසේ ම කුල අතර ද ව්‍යවහාර වෙනස්කම් දැකිය හැකි අතර තවද රැකියාව මෙන් ම සමාජයේ තත්ත්වය මත පදනම් වෙමින් රුහුණු රටට ම අනන්‍ය වූ භාෂා ලක්ෂණ බිහි වී ඇත. රුහුණු ජන වහරෙහි සුවිශේෂතා සහ එම ප්‍රාදේශීය ව්‍යවහාර හේතුවෙන් ඇතිවන ගැටලු පිළිබඳ ව අධ්‍යයනය කිරීම පර්යේෂණ ගැටලුවයි. මෙම අධ්‍යයනයේ දී උපයෝගී කොට ගත් ක්‍රමවේද වන්නේ සම්මුඛ සාකච්ඡා හා මූලාශ්‍රය පරිශීලනය යි. රුහුණු බස් වහර ලෙස හඳුන්වන්නේ දකුණු බස් වහරම ය. ගිරුවාපත්තුවේ හා ගාලු දිස්ත්‍රික්කයේ ව්‍යවහාර අතර වෙනස්කම් දැකිය හැකි ය. මෙම ව්‍යවහාර ගිරුවාපත්තුව, මාගම්පත්තුව සහ මාතර වැල්ලබඩ හා කන්දබඩ පත්තුවල ගිරුවායට තදාසන්න ප්‍රදේශයන්හි වර්තමානයෙත් නොනැසී පවතී. එහෙත් වර්තමානය වනවිට රුහුණු ප්‍රාදේශිය ව්‍යවහාරයට එල්ලවී ඇති අභියෝග පිළිබඳ විමසීමේ දී නූතන හා පැරණි ජනවහර දෙකට අයත් වැසියන් දරණ අදහස්වල යම් වෙනසක් සිදුවී ඇත. මෙම අධ්‍යයනයෙන් තහවුරුවන මූලික සංකල්ප කිහිපයකි. එනම් රුහුණේ ජනවහර කෙරෙහි පවත්නා අභියෝග ලෙස නවීන තාක්ෂණයේ බලපෑම. නූතන පරපුර සාම්ප්‍රදායික බස්වහර සමඟ මුසුවීමට ඇති මැලිකම සහ වෙනත් ප්‍රදේශයන්හි ජනතාවගේ සංක්‍රමණය ආදී වූ කරුණු හේතුවෙන් අදවන විට සාම්ප්‍රදායික බස් වහර වියැකී යන බවක් පෙන්නුම් කරයි.

ප්‍රමුඛ පද - රුහුණු බස් වහර, උපභාෂා, භාෂා ලක්‍ෂණ, සන්නිවේදනය.

— නූතන ඇතුලත් නොවේ. — උදාහරණ දෙක් ඇතුලත් කරන්න.

[1] සිංහල (විශේෂවේදී) දෙවන වසර, murungasyayesarada@gmail.com

[2] පුරාවිද්‍යා (විශේෂවේදී) සිව්වන වසර, dhammananda1994@gmail.com

[3] සිංහල (විශේෂවේදී) දෙවන වසර, badullesamitha1995@gmail.com

[4] බෞද්ධ දර්ශනය (විශේෂවේදී) සිව්වන වසර, gothamapoddiwala@gmail.com ,

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය, හෝමාගම.

Scanned by CamScanner